# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 49 — 1973 මාර්තු 02 වැනි සිකුරාද — 1973.03.02

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... | 207 |
| ජනාධිපතිතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | — | මිළ පාලන දැන්වීම් ... | 211 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය ... | — | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... | 205 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | 219 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — | "සුරාබදු අඥපනත" පිළිබඳ දැන්වීම් ... | — |


සැළකිය යුතුයි.—මැණික් (කමා කිරීමේ) පනත් කෙටුම්පත 1973 පෙබරවාරි 15 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## වෙනත් පත්කිරීම් ආදිය

**1973 අංක 97**

අංකය : සී. 252/ආර්ඊසීපී/2.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව—උසස් කිරීම්**

1972 අගෝස්තු මස 1 වෙනි දින සිට ප්ලයිට් ලෙප්ටිනන්වරු වශයෙන් :—

ප්ලයිං ඔපිසර් තිලකරත්න බණ්ඩාර පතන්වල—(01136)—පාලන.

ප්ලයිං ඔපිසර් මුදියන්සේලාගේ පාලිත විජේසූරිය—(01139)—පාලන/රෙජිමේන්තුව.

ප්ලයිං ඔපිසර් නිහාල් ධම්මික ද සොයිසා—(01140)—පාලන/රෙජිමේන්තුව.

ප්ලයිං ඔපිසර් උපාලි වනසිංහ—(01141)—කාර්මික/ඉංජිනේරු.

1972 අගෝස්තු මස 1 වැනි දින සිට තාවකාලික ප්ලයිට් ලෙප්ටිනන්වරයෙකු වශයෙන් :—

ප්ලයිං ඔපිසර් අරුණාචලම් නරේන්ද්‍ර—(01142)—කාර්මික/ඉංජිනේරු.

1973 පෙබරවාරි මස 2 වැනි දින සිට ප්ලයිට් ලෙප්ටිනන්ට්වරුන් වශයෙන් :—

ප්ලයිං ඔපිසර් මෝහන්ලාල් යනෙල් වල්පිට—01143—පාලන.

ප්ලයිං ඔපිසර් හේමේන්ද්‍ර චිරානන්ද ප්‍රනාන්දු—(01144)—පො. රා./නියමු.

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ දී ය.

3–149—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1971 මාර්තු මස 19 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. සී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

### 1973 අංක 98

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

කොළඹ 9 කැටවලමුල්ල අංක 101/6 "විජය" හි පදිංචි මානෙල් ඕසයරි විජයවීර මෙනෙවිය කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්‍රි.ව. පෙබරවාරි මස 2 වැනි දින,
කොළඹ දී ය.

3–77—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### 1973 අංක 99

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

දෙහිවල රාමනාදන් පෙදෙසේ අංක 3 දරණ ස්ථානයේ පදිංචි ඩා. සුසිල් මුණසිංහ මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්‍රි.ව. පෙබරවාරි මස 5 වැනි දින,
කොළඹ දී ය.

3–76—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### 1973 අංක 100

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

මතුගම වලගෙදර හේන්පිට "සිසිල" නිවසේ පදිංචි දොන් මික්වර් පියදාස ජාගොඩ ආරච්චි මහතා කළුතර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්‍රි.ව. පෙබරවාරි මස 5 වැනි දින,
කොළඹ දී ය.

3–88—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### 1973 අංක 101

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

ගම්පල ඉහළ සිංහපිටිය පාරේ අංක 16 දරණ ස්ථානයේ පදිංචි තුඅන් ලතීප් ජමන් හජ්ජි මහතා ගම්පල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්‍රි.ව. පෙබරවාරි මස 5 වැනි දින,
කොළඹ දී ය.

3–81—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### 1973 අංක 102

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

ලිහිණිකඩු ආරච්චිගේ දොන් අයිසැක් විමලවීර මහතා ගලේවෙල කාර්යාලයද වහකෝට්ටේ අතුරු කාර්යාලයද ඇතුව මාතලේ අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්‍රි.ව. පෙබරවාරි මස 5 වැනි දින,
කොළඹ දී ය.

3–79—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### 1973 අංක 103

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

වෙල්ලම්පොක්කඩේ කොඩිකාමම්හි පදිංචි පොන්නයියා වෙට්ටිවේළු මහතා චාවකච්චේරිය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්‍රි.ව. පෙබරවාරි මස 5 වැනි දින,
කොළඹ දී ය.

3–78—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

**1973 අංක 104**

**සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ පහත සඳහන් පත්වීම් කර ඇති බව මෙයින් දන්වනු ලැබේ :—**

සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ යූ. ආර්. ඩී. බී. මුවපිටිය මහතා 1972 දෙසැම්බර් මස 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වශයෙන්.

සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි පන්තියේ ටී. ජී. එෆ්. මැන්ඩිස් මහතා 1971 ඔක්තෝබර් මස 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, කොළඹ පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ කාර්යාල සහකාර වශයෙන් වැඩ බැලීමට.

සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ ටී. ජී. එෆ්. මැන්ඩිස් මහතා 1972 ජූලි මස 17 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, කොළඹ පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවර යාගේ කාර්යාල සහකාර වශයෙන්.

සාමාන්‍ය ලිපිකාර සේවයේ, අධි පන්තියේ ටී. බී. වීරකෝන් මහතා 1972 සැප්තැම්බර් මස 02 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, මාතලේ පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ කාර්යාල සහකාර වශයෙන්.

සාමාන්‍ය ලිපිකාර සේවයේ, අධි පන්තියේ කේ. විජේසිංහ මහතා 1972 නොවැම්බර් මස 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, මාතලේ පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ කාර්යාල සහකාර වශයෙන්.

සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි පන්තියේ ආර්. බී. සේනාරත්න මහතා 1972 පෙබරවාරි මස 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ කාර්යාල සහකාර වශයෙන් වැඩ බැලීමට.

සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි පන්තියේ ජේ. ජේ. වාස් මහතා 1972 පෙබරවාරි මස 07 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, අම්පාර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවර යාගේ කාර්යාල සහකාර වශයෙන් වැඩ බැලීමට.

සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි පන්තියේ එස්. ටී. සෙනරත් මහතා 1972 ජූලි මස 26 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, බදුල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවර යාගේ කාර්යාල සහකාර වශයෙන් වැඩ බැලීමට.

සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි පන්තියේ සී. විසාකපෙරුමාල් මහතා 1972 ජනවාරි මස 06 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ කාර්යාල සහකාර ලෙස වැඩ බැලීමට.

සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි පන්තියේ පී. එස්. ජයසිංහ මහතා 1972 අගෝස්තු මස 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර වශයෙන් වැඩ බැලීමට.

සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි පන්තියේ එම්. ඊ. බී. පෙරේරා මහතා 1972 සැප්තැම්බර් මස 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, කොළඹ පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ කාර්යාල සහකාර වශයෙන් වැඩ බැලීමට.

සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි පන්තියේ ඩබ්ලිව්. සී. එච්. ප්‍රනාන්දු මහතා 1972 සැප්තැම්බර් මස 16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ පාලන නිලධාරි ලෙස වැඩ බැලීමට.

සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි පන්තියේ ඊ. ඩී. ආර්. ගුණවර්ධන මහතා 1972 නොවැම්බර් මස 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වශයෙන් වැඩ බැලීමට.

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
(ඒකාබද්ධ සේවා අංශයේ) දී ය.

3–220—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී. බී. 23-63

**1963 අංක 11 දරන මුදල් පනත**

1963 අංක 11 දරන මුදල් පනතේ 58 (4) (උ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍යවරයා විසින් කරනු ලබන නියමය.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් අමාත්‍ය.

1973 පෙබරවාරි මස 20 වන දින,
කොළඹ දී ය.

**නියමය**

1. (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන හා පුණ්‍යාධාර භාරයක භාරකරුවකු වන තැනැත්තකුට යම් ඉඩමක් හෝ යම් සමාගමක කොටස් පැවරුමක් කරන විට—

(අ) එම පැවරුම එම අරමුදලේ කාර්යයන් සඳහා කරනු ලබන්නක් නම්;

(ආ) එම අරමුදලට භාරකරුවන් දෙදෙනකුට වඩා වෙත් නම්; සහ

(ඇ) එම අරමුදලෙහි භාරකරුවන්ගෙන් වැඩි දෙනා ශ්‍රී ලංකාවේ පුරවැසියන් නම්

ඒ පැවරුමට 1963 අංක 11 දරන මුදල් පනතේ 58 වන වගන්තියේ (1) (2) සහ (3) වන උපවගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(2) මේ නියමයෙහි ''පුණ්‍යාධාර භාරය'' යන යෙදුමට (87 වන අධිකාරය වන) භාර ආඥාපනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

3–152—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

එල්. ඩී.—බී. 7/63.

**1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත**

16අ වගන්තිය යටතේ දැන්වීම

1969අංක 6 දරණ පනතින් සංශෝධිත, 1963අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 16අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, ''සිලෝන් හාට් ඇසෝසියේෂන්'' එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් යයි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1973 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ 1.

3–153—73. 03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

**1972 අංක 9 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනත**

1 වෙනි වගන්තිය යටතේ නිවේදනය

1972 අංක 9 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනතේ 1 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක, අධිකරණ අමාත්‍යවරයා වන මම, ඒ පනතේ 2 වන වගන්තිය, 3 වෙනි වගන්තිය සහ 4 වෙනි වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වන දිනය 1973 මාර්තු මස පළමුවැනි දිනය විය යුතු බව මෙම නිවේදනයෙන් නියම කරමි.

ෆීලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක,
අධිකරණ අමාත්‍යවරයා.

1973 පෙබරවාරි මස 21 වන දින,
කොළඹ දී ය.

3-133—73.03.02 දින අංක49 දරණ ගැසට් පත්‍රය

---

**උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත**

5 වැනි වගන්තිය යටතේ නිවේදනය

(110 වන අධිකාරය වන) උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ පනතේ 5 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය, ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, 1935 සැප්තැම්බර් මස 20 වැනි දින අංක 8,146 දරණ ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පළ කරනු ලැබ කලින් කල සංශෝධනය කරනු ලැබූ නිවේදනය, එහි වූ උපලේඛනයෙහි, "නැගෙනහිර පළාත—මඩකලපුව දිස්ත්‍රික්කය" යන ශීර්ෂය යටතේ—

(1) එරාවූර් කොට්ඨාශයට අදාල අංක 12 දරණ විෂය වෙනුවට මෙහි වූ "අ" උපලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන්, හා,

(2) අංක 12 දරණ විෂයට ඉක්බිතිවම මෙහිවූ "ආ" උපලේඛනයෙහි සඳහන් අංක 12 අ, 12 ආ සහ 12 ඇ දරණ විෂයයන් ඇතුළත් කිරීමෙන්,

1973 මාර්තු මස පළමුවෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා.

1793 පෙබරවාරි මස 06 දින,
කොළඹ දීය.

**"අ" උපලේඛනය**

12. පහත සඳහන් ගම්වලින් සමන්විත එරාවූර් කොට්ඨාශය :—

| | |
|---|---|
| එරාවූර් 1 වැනි කොට්ඨාශය | මීරාඩකෝණි |
| එරාවූර් 3 වැනි කොට්ඨාශය | පුන්නෛකුඩා (කොටස) |
| අයියන්කේණි (කොටස) | දළවායි (කොටස) |
| දාමරයිකේණි | |

**"ආ" උපලේඛනය**

12 අ. පහත සඳහන් ගම්වලින් සමන්විත ආරුමුකත්තාන් කුඩියිරුප්පු කොට්ඨාශය :

| | |
|---|---|
| ආරුමුකත්තාන් කුඩියිරුප්පු | සවුක්කඩි |
| මයිලම්පාවෙලි | දන්තාමුනෙයි |
| වේඩකුඩිරුප්පු | |

12. ආ. පහත සඳහන් ගම්වලින් සමන්විත පන්කුඩාවෙලි කොට්ඨාශය :

| | |
|---|---|
| එරාවූර් 4 වැනි කොට්ඨාශය | පාලමඩු |
| එරාවූර් 5 වැනි කොට්ඨාශය | පන්කුඩාවෙලි |
| ඉලුප්පඩිචේනයි | පුන්නයිකුඩා (කොටස) |
| අයියන්කේණි (කොටස) | සංකුලයි |
| කොම්බර්චේනයි | දළවයි (කොටස) |
| මක්කුලානයි | දොඩුවිල්චෝලයි |
| නෙල්ලිපොඩියාර්ගල් චේනයි | වෙප්පවට්ටවාන් |

12 ඇ. පහත සඳහන් ගම්වලින් සමන්විත රුගම් කොට්ඨාශය :

| | |
|---|---|
| කරඩියනාරු | පුල් ලුමලයි නොහොත් පෙරියපුල් ලුමලයි |
| කරඩියන්කුලම් | පුත්තම්පුරි |
| කිතුල් වැව | රුගම් පුදූර් |
| කොප්පාවෙලි | සින්නපුල් ලුමලයි |
| කොස්ගල්ල | සොකම්බි |
| කොට්ටස | දරුපුල් ලුවෙලි |
| කුඹුරුවෙලි | දුම්බලන්චෝලයි |
| මරප්පාලම් | උරුගාමම් |
| මාවඩිචේනයි | වෙල් ලයිගල් දළවායි |
| මාවලයිආරු | වෙලිගණ්ඩිය |

3-23—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

**1968 අංක 14 දරන සංචාරික සංවර්ධන පනත**

2 (1) වගන්තිය යටතේ ආඥාව

1968 අංක 14 දරන සංචාරික සංවර්ධන පනතෙහි 2 (1) වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, නැව් කටයුතු හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යවර පුංචි බණ්ඩා ගුණතිලක කළුගල්ල වන මම, 1966 අංක 10 දරන පනතින් පිහිටුවන ලද රජයේ සංස්ථාවක් වන ලංකා සංචාරක මණ්ඩලයේ සංචාරික සංවර්ධන යෝජනා ක්‍රමයක කාර්යයන් උදෙසා, මතු දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉඩම් අත්පත් කර ගැනීම, මෙම ආඥාව මගින් අනුමත කරමි.

පී. බී. ජී. කළුගල්ල,
නැව් කටයුතු හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

1973, පෙබරවාරි මස 19 වන දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුනේ අළුත්ගම් බද්දේ මොරගල්ලෙහි පිහිටියා වූ ද බලයලත් මිනින්දෝරු ජී. අබේපිටිය විසින් සාදන ලද අංක 312 සහ 1971 දෙසැම්බර් 5 සහ 20 දින දරණ පිඹුරෙහි කැබලි අංක ඒ 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 17.850 කින් යුත්—

උතුරින් : පුංචිමාලිමියවත්ත හෙවත් දොඹගහවත්ත පුංචිමාලිමියවත්ත හෙවත් පුංචිනායිදෙගෙවත්ත සහ පුංචිමාලිමියවත්ත හෙවත් ඇල්ගෙවත්ත සහ මූසිගවෙලින් කොටස් ;

නැගෙනහිරින් : මූසිගවෙල සහ පාළුගෙදරවත්ත හෙවත් පරතොල්ලවත්තෙන් කොටස් ;

දකුණින් : මහමාලිමියවත්ත හෙවත් ගුරුන්නැහැලගෙවත්ත (දැන් පවතින කොන්පිපි බීච් හෝටලයේ පිටස්තර සීමා බැම්ම), සහ

බටහිරින් : මහාමාලිමියවත්ත හෙවත් ගුරුන්නැහැලගෙවත්ත (දැන් පවතින කොන්පිපි බීච් හෝටලයේ පිටස්තර සීමා බැම්ම) සහ පාර

යන මායිම්වලින් සමන්විත වූ ද පුංචිමාලිමියවත්ත හෙවත් දොඹගස්වත්ත, පුංචිමාලිමියවත්ත හෙවත් පුංචිනායිදෙනුගෙවත්ත, පුංචිමාලිමියවත්ත හෙවත් ඇල්ගෙවත්ත සහ මූසිගවෙල සහ පාළු ගෙදර වත්ත හෙවත් පරතොල්ල වත්ත යැයි හැඳින්වෙන, සියළු භූමි භාගය ඇතුළත, එහි ඔස්සේ සහ එය උඩින් පසින් සහ වාහන වලින් ගමන් කිරීමේ සම්පූර්ණ අයිතිය සහ බලය.

3-151—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

### මාස්ටර් ඇටෙන්ඩන්ට් ආඥාපනත

(369 වැනි අධිකාරය වන) මාස්ටර් ඇටෙන්ඩන්ට් ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ කොළඹ වරාය සඳහා නාවික කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යවරයා විසින් සාදා පිහිට වූ රීති.

පී. බී. ජී. කළුගල්ල,
නාවික කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍ය.

1973 පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

#### රීති

1936 ඔක්තෝබර් මස 16 වැනි දින අංක 8,251 දරණ ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පළ කරනු ලැබ, කලින් කල සංශෝධනය කරනු ලැබූ, 1936, කොළඹ වරාය රීති, එහි 54 අ වැනි රීතියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් රීති එකතු කිරීමෙන් මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

54ආ. මාස්ටර් ඇටෙන්ඩන්ට් විසින් ඒ සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ මිස කිසිම තැනැත්තකු වරාය තුළ කුණු කසළ ඉවත් කිරීමේ කාර්යය නො කළ යුතුය.

54ඇ. (i) 54ආ වැනි රීතියෙහි සඳහන් බලපත්‍රයක් ලබා ගැනීමට බලාපොරොත්තු වන සෑම තැනැත්තකු විසින්ම ඒ සඳහා මාස්ටර් ඇටෙන්ඩන්ට් වෙත ලියවිල්ලකින් වූ ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ යුතුය.

(ii) එබඳු සෑම ඉල්ලුම් පතකම පහත සඳහන් කරුණු සඳහන් විය යුතුය :—

(අ) ඉල්ලුම්කරුගේ නම, ඉල්ලුම්කරු වන්නේ සමාගමක්, වෙළඳ ආයතනයක් හෝ හවුල් ව්‍යාපාරයක් නම්, එහි ව්‍යාපාරික ලිපිනය, සහ අවස්ථාවෝචිත පරිදි, අධ්‍යක්ෂවරුන්ගේ, අයිතිකරුවන්ගේ හෝ හවුල්කරුවන්ගේ නම් ;

(ආ) ඉල්ලුම්කරුගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය ;

(ඇ) ඉල්ලුම්කරු, (145 වැනි අධිකාරය වන) සමාගම් ආඥාපනත යටතේ ලියාපදිංචි සමාගමක් වන කල්හි එම සමාගමේ ලියාපදිංචි අංකය.

54. ඈ.

(අ) මාස්ටර් ඇටෙන්ඩන්ට් විසින් ඔහු අවශ්‍ය යැයි සලකන පරීක්ෂණයකින් පසු එබඳු කාර්යයක් ප්‍රමාණවත් ලෙස ඉටු කිරීමට ඉල්ලුම්කරුට නොහැකි බව ඔහු අදහස් කරන්නේ නම් එවැනි බලපත්‍රයක් දීම, ප්‍රතික්ෂේප කිරීමද ;

(ආ) වරාය කොමිෂන් සභාව විසින් හෝ කෙලින්ම හෝ සංයුක්ත මණ්ඩලයක් මගින් හෝ මූල්‍යමය වශයෙන් රජය සැලකිලිමත් වන වෙනත් යම් ආයතනයක් විසින් හෝ එබඳු කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කිරීමට හැකි වෙතැයි ඔහු අදහස් කරන්නේ නම් එවැනි බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමද නීත්‍යනුකූල විය යුතුය.

54 ඉ.

(අ) එවැනි යම් තැනැත්තෙක් එම කාර්යය අකාර්යක්ෂම ලෙස හෝ නිසි ආරක්ෂා විධිවිධාන නොමැතිව හෝ ප්‍රවේශමක් නොමැතිව කරගෙන යන්නේ නම් ;

(ආ) වරාය කොමිෂන් සභාව විසින් හෝ කෙලින්ම හෝ සංයුක්ත මණ්ඩලයක් මගින් හෝ මූල්‍යමය වශයෙන් රජය සැලකිලිමත් වන වෙනත් යම් ආයතනයක් විසින් හෝ එබඳු කාර්යයක් ප්‍රමාණවත් ලෙස ඉටු කිරීමට හැකි වෙතැයි මාස්ටර් ඇටෙන්ඩන්ට් අදහස් කරන්නේ නම්, එවැනි බලපත්‍රයක් මාස්ටර් ඇටෙන්ඩන්ට් විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල විය යුතුය,

3–41—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

එල්. ඩී.—බී. 23/50.

### උකස් පනත

(89 වන අධිකාරය වන) උකස් පනතේ 3 (ඇ) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සහ එම පනතේ 114(2) වන වගන්තිය යටතේ කරන ලද මණ්ඩලයේ නිර්දේශය පිට වාණිජ අධ්‍යක්ෂ කිරිබණ්ඩා දිසානායක වන මම, මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කර ඇති එක් එක් ආයතනය, එම පනතේ කාර්යයන් සඳහා ණය දෙන අනුමත කළ ආයතනයක් විය යුතු යයි මේ නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

කි. දිසානායක,
වාණිජ අධ්‍යක්ෂ,

1973.2.14
කොළඹ දී ය.

උපලේඛනය

1. ද රූපී පිනෑන්ස් සමාගම.
2. සීමාසහිත එල්. බී. පිනෑන්ස්.

3–29/1—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

එල්.ඩී.—බී. 16/53.

### භාරකාර ආදායම් පනත

(86 වන අධිකාරය වන) භාරකාර ආදායම් ආඥාපනතේ 5 (1) (අ) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වාණිජ අධ්‍යක්ෂ කිරිබණ්ඩා දිසානායක වන මෙම, මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කර ඇති එක් එක් ආයතනය එම ආඥාපනතේ කාර්‍යයන් සඳහා අනුමත කළ ණය දෙන ආයතනයක් විය යුතු යයි මේ නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

කි. දිසානායක,
වාණිජ අධ්‍යක්ෂ,

1973. 2. 14
කොළඹ දීය.

උපලේඛනය

1. ද රූපී පිනෑන්ස් සමාගම.
2. සීමාසහිත එල්. බී. පිනෑන්ස්.
3. සීමාසහිත පින්කෝ.

3–29/2—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

එල්.ඩී.—බී.

### පඩිපාලක සභා ආඥාපනත

#### නිවේදනයයි

(136 වැනි අධිකාරයයි වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් ගිනිපෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් ඒ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම සභාව අදහස් කරන බව එකී ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒ සභාව විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතා 1973 මාර්තු මස 30 වැනි දින දවල් 12 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරුද්ධතාවයක්ම එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතු ය.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
ගිනිපෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ
පඩිපාලක සභාවේ සභාපති.

1973 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ 5, කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

ගිනිපෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1947 මැයි මස 30 වන දින අංක 9,708 දරණ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද කලින් කල වෙනස් කරන ලද්දාවූ ද තීරක, එම උපලේඛනයෙහි IV වන කොටසෙහි "ආණ්ඩුවේ නිවාඩු දවස්" යන ශීර්ෂය යටතේ I වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය :—

"ආණ්ඩුවේ නිවාඩු දවස්"

1. (අ) මේ ඡේදයේ සහ 2 වන ඡේදයේ විධිවිධානවලට යටත්ව සෑම සේවා යෝජකයෙකුම තමා යටතේ සේවයෙහි යොදවා සිටින සියලුම කම්කරුවන්ට 1971 අංක 29 දරන නිවාඩු පනතෙහි අර්ථානුකූලව පහත දක්වෙන ආණ්ඩුවේ නිවාඩු දිනයන් පඩි සහිතව නිවාඩු දින වශයෙන් දිය යුතුය :—

(1) දෙමළ තෛපොන්ගල් දිනය ;

(2) සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනට පෙරාතුවම වූ දිනය;

(3) සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනය ;

(4) මැයි දිනය (මැයි 1);

(5) සිංහල වෙසක් මාසයේ පුර පසළොස්වක් පොහෝ දිනය ;

(6) සිංහල වෙසක් මාසයේ පුර පසළොස්වක පොහෝ දිනයට ඉක්බිතිවම එළඹෙන දිනය;

(7) ජනරජ දිනය (මැයි 22) ;

(8) මහ සිකුරාදා ;

(9) නත්තල් දිනය.

(ආ) අනුඡේදයෙහි සඳහන් එක් එක් නිවාඩු දිනය වෙනුවෙන් කම්කරුවකුට ගෙවිය යුතු වේතනය, එම නිවාඩු දිනය යෙදුණු මාසයේ වැඩ කරන සාමාන්‍ය දින කට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය විය යුතුය."

3–170—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### පඩිපාලක සභා ආඥපනත

### නිවේදනයයි

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥපනතේ 30 වැනි වගන්තියෙන් දුම්කොළ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහිවූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් ඒ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩිපාලක සභාව අදහස් කරන බව එකී ආඥ පනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒ සභාව විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතා 1973 මාර්තු මස 16 වැනි දින දවල් 12 දක්වා පඩිපාලක සභාවේ සභාපති විසින් බාරගනු ලැබේ.

ඉදිරිපත් කරන ඒ සෑම විරුද්ධතාවක් ම එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
දුම්කොළ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සභාපති.

1973 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ 5,
කම්කරු මහලේකම් කාර්යාලයේ දී ය.

### උපලේඛනය

දුම්කොළ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරන ලදුව, 1966 අප්‍රේල් මස 28 වැනි දින අංක 14,692/6 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි දක්වා ඇත්තාවූ ද, වර්ෂ 1972 සැප්තැම්බර් මස 29 වැනි දින අංක 27 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කරන ලද්දාවූ ද තීරණ, එම උපලේඛනයෙහි V වැනි කොටසේ "ආණ්ඩුවේ නිවාඩු දවස් (25 වැනි වගන්තිය)" යන ශීර්ෂය යටතේ ඇති 1 වැනි ඡේදයේ (අ) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අළුත් අනුච්ඡේදය ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය :—

"ආණ්ඩුවේ නිවාඩු දවස් (25 වැනි වගන්තිය)"

(අ) මෙම ඡේදයෙහි හා මෙහි වූ 2 වැනි ඡේදයෙහි විධිවිධාන වලට යටත්ව සෑම සේවා යෝජකයකුම තමා යටතේ සේවයේ යොදවා ගෙන සිටින සියළුම කම්කරුවන්ට වර්ෂ 1971 අංක 29 දරණ නිවාඩු පනත යටතේ සැලකෙන පහත සඳහන් ආණ්ඩුවේ නිවාඩු දවස් එකී එක් එක් නිවාඩු දිනයට පෙරාතුවම වූ වැඩ කරන දින 7 ක කාලය ඇතුළත ඒ කම්කරුවා තමා යටතේ දින 3 කට නොඅඩු කාලයක් වැඩ කර ඇතහොත්, පාරිශ්‍රමිකය සහිත නිවාඩු දිනයක් වශයෙන් දිය යුතු ය :—

(1) දෙමළ තෛපොන්ගල් දිනය ;

(2) සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනට පෙරාතුවම වූ දිනය ;

(3) සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනය ;

(4) මැයි දිනය (මැයි 1) ;

(5) සිංහල වෙසක් මාසයේ පුන් පොහෝ දිනයට ඉක්බිතිවම එළඹෙන දිනය ;

(6) ජනරජ දිනය (මැයි 22) ;

(7) මිලා-දුන්-නබි (මොහොමඩ් නබි නායකතුමාණන් වහන්සේ උපන් දිනය) ;

(8) බණ්ඩාරනායක අනුස්මරණ දිනය (සැප්තැම්බර් 26) ;

(9) නත්තල් දිනය.

3–174—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

### පඩිපාලක සභා ආඥපනත

### නිවේදනයයි

පඩිපාලක සභා ආඥපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ කම්කරු ඇමතිතුමන් විසින් සාත්තු නිවාස ව්‍යාපාරය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයකු වූ පෝල් ස්ටර්ච් මහතා දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළ ඔහු වෙනුවෙන් වැඩ බැලීමට පත් කරනු ලැබ සිටි ටී. ඒ. මෝයි මහතාගේ පත්වීම, පෝල් ස්ටර්ච් මහතා ආපසු පැමිණ එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයකු වශයෙන් යළි වැඩ භාරගත් 1973 ජනවාරි මස 29 වැනි දින පටන් කෙළවර වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. ඒ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

3–168—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

8939

**1954 අංක 37 දරණ ජාතික නිවාස පනත 49 ඡේදය යටතේ සහතිකය**

නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජේරාල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

පී. බී. ජේ. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

සාපාශා./අත්/129.
1973 පෙබරවාරි මස 15 වන දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය ග්‍රාම සේවක කොට්ඨාශයේ උද්‍යාන පාරේ වරිපනම් අංක 181 දරණ ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අඩි 4ක් පමණ පළල අඩි 225 ක් පමණ දිග බිම් තීරයක් :—

උතුරට: ඉහත ඉඩමේ ඉතිරි කොටස ;

නැගෙනහිරට : රජය සතු ඉඩම ;

දකුණට : උද්‍යාන පාර ;

බස්නාහිරට : නගර සභාවට අයිති කාණුව.

3–82—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

8939

**1954 අංක 37 දරණ ජාතික නිවාස පනත 49 ඡේදය යටතේ සහතිකය**

නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජේරාල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

පී. ජේ. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

කොළශා./අත්/41.
1973 පෙබරවාරි මස 13 වන දින,
කොළඹ දීය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ ගම්පහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ බැලුම්මහර ග්‍රාම සේවක කොට්ඨාශයේ නුවර පාරේ පිහිටි වැල්ලබොඩවත්ත නොහොත් මිල්ලගහවත්ත නැමති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කරයක පමණ ඉඩම් කොටසක් :—

උතුරට : ජී. බේබි නෝනාට අයිති ඉඩම ;

නැගෙනහිරට : කොළඹ නුවර පාර ;

දකුණට : ජී. පීටර් සිංඤෝට අයිති ඉඩම් ;

බස්නාහිරට : කරත්ත පාර.

3–75—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

# මිල පාලන දැන්වීම්

අංක : ටී/මිපා/3 දරණ ආහාර මිළ නියෝගය — තිරිඟු පිටි

**මිළ පාලන පනත**

**නියෝගය**

ත්‍රිකුණාමලය පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත්, හියු කොල්මන් ඔරිල්ටන් ඊබට් වන මම (173 අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වන වගන්තියෙන් සහ එම පනතේ 3 (2) වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(i) 1968 නොවැම්බර් 8 වන දින සහ අංක 14,827/1 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මාගේ 1968 නොවැම්බර් 6 වන දින සහ අංක ටී/5/68 දරණ ආහාර මිළ නියෝගය මේ දන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(ii) මීට යා කර ඇති උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් කර තිබෙන මිළ ගණන් තිරිඟු පිටි තොග වශයෙන් විකිණීමේ දී දළ බර රාත්තල් 150 ක් එම උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් සීමාවන් ඇතුළත තොග වශයෙන් විකිණිය හැකි වැඩි ම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(iii) මීට යා කර ඇති දෙවැනි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් මිළ ගණන් තිරිඟු පිටි සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක් එම උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත මේ දන් පටන් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(iv) තව ද මෙම නියෝගයේ කාර්යය සඳහා—

(අ) තිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා හෝ තිරිඟු පිටි වරකට දළබර රාත්තල් 150 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොගවශයෙන් විකිණීමක් ලෙස සළකන බවත් ;

(ආ) තිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධබර රාත්තල් 148 කට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකන බවත් ;

(ඇ) "තිරිඟු පිටි" යන්නට ඉරිඟු පිටි හා තිරිඟු පිටි කලවම් කරන ලද මිශ්‍රණයක් ඇතුළත් වන බවත් නියම කරමි.

(v) මෙම නියෝගයෙන් උපරිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයක් ඇතුළත කිසිවෙකු විසින් තිරිඟු පිටි, බඩ ඉරිඟු පිටි හැර වෙනත් කිසිම ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කර නොවිකිණිය යුතු බවත් නියම කරමි ;

(vi) බරින් 10% කට වැඩියෙන් ඉරිඟු පිටි කළවම් කරන ලද තිරිඟු පිටි කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව මෙයින් නියම කරමි ;

(vii) තව ද, මෙම නියෝගයෙන් උපරිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක තිරිඟු පිටි සිය ස්වාමිත්වයේ හෝ පාලනයේ යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකු ම තිරිඟු පිටි වලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා මෙම නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා නොඅඩු ඉලක්කම් මිළ පුවරුවල සටහන් කොට එම භාජනයට සම්බන්ධකොට නිශ්චිත මිළ ඕනෑම ගණුදෙනුකාරයෙකුට පැහැදිලි ව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි ;

(viii) එසේම මෙම නියෝගයේ කාර්යය සඳහා "රාත්තල්" හෝ "රා" යන්නෙන් අදහස් කරනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව නියම කරමි ;

(ix) තිරිඟු පිටි විකිණීමේ දී එම තිරිඟු පිටි යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහා ලනු ලැබේ නම් එහි මිළත් මෙම නියෝගයෙන් නියම කරනු ලබන වැඩි ම මිළ ගණන් වලට ඇතුළත් වන බව ද නියම කරමි ;

(x) තව ද, මෙම නියෝගයෙන් උපරිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයක ම තොග වශයෙන් තිරිඟු පිටි විකුණන සෑම තැනැත්තෙකුම හා සිල්ලර වශයෙන් තිරිඟු පිටි විකුණන සෑම තැනැත්තෙකුම විසින් මිළයට ගන්නා විසින් ඉල්ලන ලදහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ තිරිඟු පිටිවල බර ප්‍රමාණය ;

(ඇ) විකුණූ තිරිඟු පිටි ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය, එනම් තොග වශයෙන් ද, සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නා වෙත නිකුත් කළ යුතු බව ද නියම කරමි.

1973 පෙබරවාරි මස 15 වෙනි දින පෙ.ව. 9.45 ට ත්‍රිකුණාමලයේ දී අත්සන් කරන ලදී.

එච්. සී. ඕ. ඊබට්,
සහකාර (ආහාර) මිළ පාලක, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.

පළමුවන උපලේඛනය

| | 1 තීරය<br>ප්‍රදේශ | 2 තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් තිරිඟු දළ බර රාත්තල් 150ක් තොග වශයෙන් විකිණිය හැකි මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. | ත්‍රිකුණාමලය නගරය සහ කඩවත් කරවන ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශය ... ... ... | 57 17 |
| 2. | කන්තලේ ප්‍රා.ආ.නි. කොට්ඨාශය ... ... ... ... ... | 57 60 |
| 3. | කින්නියා ප්‍රා.ආ.නි. කොට්ඨාශය ... ... ... ... ... | 57 40 |
| 4. | තඹලගමුව ප්‍රාදේශීය උප දිසාපති තැනගේ කොට්ඨාශය තුළ පිහිටි තඹලගමුව උතුර සහ දකුණු යන ග්‍රා.සේ. කොට්ඨාශය | 57 44 |
| 5. | බටහිර කට්ටුක්කුලම් පත්තුවේ ප්‍රාදේශීය උප දිසාපති තැනගේ කොට්ඨාශය සහ නැගෙණහිර කට්ටුකුලම් පත්තුව ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය ... ... ... ... ... | 57 70 |
| 6. | මුතූර් සහ සේරුවිල ප්‍රා.ආ.නි. කොට්ඨාශ ... ... ... ... ... | 57 79 |

දෙවන උපලේඛනය

| | 1 තීරය<br>ප්‍රදේශය | 2 තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් තිරිඟු පිටි රාත්තලක් විකිණිය හැකි උපරිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. | ත්‍රිකුණාමලය නගරය සහ කඩවත් කරවන ප්‍රාදේශීය සහකාර උප දිසාපති කොට්ඨාශය තුළ පිහිටි සාම්බල්තිව් සාම්බල් තිව් උප්පුවෙලි, වෙල්ලමනල් කොට්ඨාශ සහ චීන වරාය යන ග්‍රා.සේ. කොට්ඨාශ සහ නගර සභා පෙදෙස, කන්තලේ ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය තුළ පිහිටි කන්තලේ ග්‍රාම සේවක කොට්ඨාශ, සහ තඹලගමුව ප්‍රාදේශීය උප දිසාපති තැනගේ කොට්ඨාශය තුළ පිහිටි තඹලගමුව උතුර සහ දකුණු යන ග්‍රා.සේ. කොට්ඨාශ කින්නියාව ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය තුළ පිහිටි පෙරිය කින්නියාව, සින්නකින්නියාව, නැගෙණහිර සහ බටහිර කුරින්ජර්කර්නි යන ග්‍රා.සේ. කොට්ඨාශය ... ... ... ... ... ... | 0 40 |
| 2. | බටහිර කට්ටුකුලම් පත්තුවේ ප්‍රාදේශීය සහකාර උප දිසාපතිතැනගේ කොට්ඨාශය තුළ පිහිටි පනිකට්ටුමුරුප්පු, ගෝමරන් කඩවල ගල්කඩවල, සහ මැදවච්චිය යන ග්‍රාම සේවක කොට්ඨාශ සහ නැගෙණහිර කට්ටුකුලම් පත්තුව ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය තුළ පිහිටි කුඹුරුපිටිය නිලාවැලි යන ග්‍රා.සේ. කොට්ඨාශ, කුච්චවේලි ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය තුළ පිහිටි කුච්චවේලි ග්‍රා.සේ. කොට්ඨාශ, මූතූර් ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය තුළ පිහිටි මල්ලිකතිව්, තොප්පූර්, පල්ලිකුඩිරිප්පු සම්පූර්, කට්ටෛපරිච්චාන්, කුනකීව්, මූතූර් (දෙමළ) සහ මූතූර් (මුස්ලිම්) යන ග්‍රා.සේ. කොට්ඨාශ, සේරුවිල ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය තුල පිහිටි ඊච්චිලම් පත්තෙ ග්‍රා.සේ. කොට්ඨාශය, මූත්තූර් ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය තුළ පිහිටි මෙන්කාමම් සහ කිලිවෙඩ්ඩි යන ග්‍රා.සේ. කොට්ඨාශය ... | 0 41 |
| 3. | සේරුවිල ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශයේ ඊච්චිලම්පත්තෙ ග්‍රා.සේ. කොට්ඨාශය තුළ පිහිටි වෙරුගල් මුහතුවාරම් සහ ග්‍රා.සේ. කොට්ඨාශ ... ... ... ... ... ... | 0 42 |

සැළකිය යුතුයි.—මෙම මිළ ගණන් විකිණිය යුතු නියම මිළ නොවේ. මේවා විකිණිය හැකි උපරිම මිළ වන අතර එම මිළ ගණන් වලට ඉහළින් විකිණිය යුතු නොවේ.

ප්‍රා.ස.උ.දි.—තේරුම : ප්‍රාදේශීය උප දිසාපති.

3-31/1—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

**ආහාර මිළ නියෝගය අංකය : ත්‍රි/පා.මි./5** **සුදු සීනි ( ශුද්ධ කළ)**

**මිළ පාලන පනත**

**නියෝගය**

ත්‍රිකුණාමලය පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් හියු කොල්මන් ඔරිල්ටන් ඊබට් වන මම (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වන ඡේදය හා කියවෙන 3 (2) වන ඡේදයෙන් සහකාර මිළ (ආහාර) පාලක වෙත පැවරී ඇති බලතල අනුව, 1967 දෙසැම්බර් 3 වැනි දින අංක 14,777/5 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1967 නොවැම්බර් 24 වෙනි දින අංක ටී/8/67 දරණ ආහාර මිළ නියෝගය මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

1973 පෙබරවාරි මාසයේ 15 වැනි දින ත්‍රිකුණාමලයේ දී අත්සන් කරන ලදී.

එච්. සී. ඕ. ඊබට්,
ත්‍රිකුණාමල පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක.

3-31/2—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

අංක : ත්‍රි/මීපා/4 දරණ ආහාර මිළ නියෝගය — පාන්

මිළ පාලන පනත

නියෝගය

ත්‍රිකුණාමලය පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත්, හියු කොල්මන් ඔරිල්ටන් ඊබට් වන මම (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 3 වැනි වගන්තියේ 2 වැනි උප වගන්තිය සමග කියැවෙන එම පනතේ 4 වන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1967 දෙසැම්බර් 3 වන දින සහ අංක ; 14,777/5 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1967 නොවැම්බර් 24 වන දින සහ ටී/7/67 දරණ මාගේ ආහාර මිළ නියෝගය මේ දුන් සිට අවලංගු කරමි.

(2) මීට යා කර ඇති උපලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල සඳහන් මිළ, එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල පිළිවෙලින් අවුන්ස 16 සහ අවුන්ස 8 පාන් ගෙඩි මේ දුන් සිට විකිණිය හැකි උපරිම මිළ බවත්, එකී මිළට වැඩියෙන් එම ප්‍රදේශ වල එම පාන් ගෙඩි නොවිකිණිය යුතු බවත්, මෙම නියෝගයෙන් නියම කරමි ;

(3) තවද, මෙම මිළ නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 16 පාන් ගෙඩියකට නියමිත උපරිම මිළේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන් එම ප්‍රදේශය තුළ අවුන්ස 8 කට වඩා බර පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8 කට වඩා බර කිසියම් කොටසක් නොවිකිණිය යුතු බවත් ;

(4) මෙම මිළ නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 8 පාන් ගෙඩියකට නියමිත උපරිම මිළේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන් එම ප්‍රදේශය තුළ අවුන්ස 8 කට වඩා බර නොවූ පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8 කට වඩා බර නොවූ කිසියම් කොටසක් නොවිකිණිය යුතු බවත් ;

(5) පාන් විකුණන විට ඔතා දෙනු ලබන දෙයක් වෙතොත් එහි මිළත් මෙම නියෝගයෙන් නියමිත උපරිම මිළ ගණන්වලට ඇතුළත් බවත් ;

(6) මෙම නියෝගයෙන් උපරිම මිළ නියෝග කර ඇති සෑම ප්‍රදේශයකම සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ කිසියම් ස්ථානයක හෝ වාහනයක ඇති වෙළෙන්දෙකු මෙම නියෝගයෙන් පාන් සඳහා නියමිත උපරිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් පැහැදිලිව පෙනෙන සේ එම ස්ථානයේ හෝ වාහනයේ හෝ තැබිය යුතුය යන බවත් ;

(7) මෙම නියෝගයෙන් උපරිම මිළ නියම කර ඇති සෑම ප්‍රදේශයකම පාන් විකුණන සෑම කෙනෙක් ම, මිළයට ගන්නා අයෙකු ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ පාන් ගෙඩියේ විස්තර ;

(ඇ) විකුණූ ප්‍රමාණය ;

(ඈ) විකුණූ පාන්වලට ගෙවූ මුදල ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාහට දිය යුතු බවත්, නියම කරමි ;

(8) තවද "අවුන්ස" යනුවෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත අවුන්සයේ බර බවද නියෝග කරමි.

1973 පෙබරවාරි මස 15 වන දින පෙ. ව. 9.30ට ත්‍රිකුණාමලයේදී අත්සන් කරන ලදි.

එච්. සී. ඕ. ඊබට්,
සහකාර (ආහාර) මිල පාලක, ත්‍රිකුණාමලය
දිස්ත්‍රික්කය.

පාන්

උපලේඛනය

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය |
|---|---|---|
| | අවුන්ස 8 කට වඩා බර පාන් සඳහා අදල උපරිම මිළ | අවුන්ස 8 ක් හෝ ඊට අඩු පාන් සඳහා අදල උපරිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| 1. ත්‍රිකුණාමලය නගරය සහ කඩවත් කරවන ප්‍රාදේශීය සහකාර උපදිසාපති කොට්ඨාශය තුළ පිහිටි සාම්බල්තිවු උප්පුවෙලි, වෙල්ලමනල් සහ චීන වරාය යන ග්‍රා.සේ. කොට්ඨාශ සහ නගර සභා පෙදෙස | 0 42 (අවුන්ස 16ක්) | 0 21 (අවුන්ස 8ක්) |
| 2. බටහිර කට්ටුකුලම් පත්තුවේ ප්‍රදේශීය උප දිසාපති තැනගේ කොට්ඨාශය තුළ පිහිටි (පැණිකැටියාව) ගෝමරන්කඩවල ගල්කඩවල, මැදවච්චිය යන ග්‍රාම සේවක කොට්ඨාශ සහ නැගෙනහිර කට්ටුකුලම් පත්තුව (කුච්චවෙලි) ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය තුළ පිහිටි කුඹුරුපිටිය, නිලාවෙලි යන ග්‍රාමසේවක කොට්ඨාශ කන්තලේ ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය තුළ පිහිටි කන්තලේ ග්‍රාම සේවක කොට්ඨාශය තඹලගමුව ප්‍රාදේශීය උප දිසාපති තැනගේ කොට්ඨාශය තුල පිහිටි තඹලගමුව උතුර සහ දකුණ යන ග්‍රා.සේ. කොට්ඨාශ කින්නියාව ප්‍රා. ආ. නි. තැනගේ කොට්ඨාශය තුළ පිහිටි පෙරියකින්නියාව, සින්න කින්නියාව නැගෙනහිර සහ බටහිර කුරින්වාකරනි යන ග්‍රා.සේ. කොට්ඨාශ, මූතූර් ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය තුළ පිහිටි මල්ලිකතිව් කොප්පූර්, පල්ලිකුඩිඉරිප්පු සම්පූර් කට්ටෙයි පරිච්චාන්, කුනතිවු, මුත්තූර් (දෙමළ) සම මුස්ලිම් යන ග්‍රා.සේ. කොට්ඨාශය | 0 44 (අවුන්ස 16 ක්) ... | 0 22 (අවුන්ස් 8ක්) |
| 3. නැගෙනහිර කට්ටුකුලම් පත්තුව ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය තුළ පිහිටි තිරියාය සහ කුච්චවෙලි යන ග්‍රා.සේ. කොට්ඨාශ ;සේරුවිල ප්‍රා.ආ.නි. තැනගේ කොට්ඨාශය තුළ පිහිටි ඊච්චිලම්පත්තුව ග්‍රා සේ. කොට්ඨාශය අහ මූතූර් ප්‍රා. ආ. නි. තැනගේ කොට්ඨාශය තුළ පිහිටි මෙන්කාමම්, කිලිවෙට්ටි යන ග්‍රා.සේ. කොට්ඨාශය | 0 45 (අවුන්ස 16 ක්) | 0 23 (අවුන්ස 8ක්) |

සැලකිය යුතුයි .—මෙම මිළ ගණන් පාන් විකිණිය යුතු නියම මිළ නොවේ. මේවා පාන් විකිණිය හැකි උපරිම මිළ වන අතර එම මිළ ගණන්වලට ඉහළින් විකිණිය යුතු නොවේ.

3–31/3—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

**අංක 1973 ජී 3 දරණ ආහාර මිල නියෝගය.** **පාන්.**

මිල පාලන පනත

ගාලු දිස්ත්‍රික්කයේ සහකාර මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) නැන්පත් හෙන්රි විජේතිලක වන මම (173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 3 (2) වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මේ ආඥාවෙන්—

(1) 1967 දෙසැම්බර් මස 03 දින අංක 14,777/5 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලවූ අංක 1967 ජී 7 දරණ ආහාර මිල ආඥාව වහාම බලපැවැත් වෙන පරිදි අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 වැනි සහ 3 වැනි තීරවල සඳහන් මිල, එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල පිලිවෙළින් අවුන්ස 16 හා අවුන්ස 8 පාන් ගෙඩි මේ දන් සිට විකිණිය හැකි උපරිම මිල බවත් එකී මිලට වැඩියෙන් එම ප්‍රදේශවල එම පාන් ගෙඩිය නොවිකිණිය යුතු බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම මිල නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 16 පාන් ගෙඩියකට නියමිත වැඩිම මිලේ අනුපාතය අනුව වැටහෙන මිලට වැඩියෙන් එම ප්‍රදේශය තුල අවුන්ස 8කට වඩා බර පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8කට වඩා බර කිසියම් කොටසක් නොවිකිණිය යුතු බවත් ;

(4) මෙම මිල නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 8 පාන් ගෙඩියට නියමිත වැඩිම මිලේ අනුපාතය අනුව වැටහෙන මිලට වැඩියෙන් එම ප්‍රදේශය තුල අවුන්ස 8කට වඩා බර නොවූ පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8කට වඩා බර නොවූ කිසියම් කොටසක් නොවිකිණිය යුතු බවත් ;

(5) පාන් විකුණන විට මතා දෙනු ලබන දෙයක් වෙතොත් එහි මිලත් මෙම නියෝගයෙන් නියමිත උපරිම මිල ගණන්වලට ඇතුලත් බවත් ;

(6) මෙම නියෝගයෙන් වැඩිම මිල නියම කොට ඇති සෑම ප්‍රදේශයකම සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ කිසියම් ස්ථානයක හෝ වාහනයක පාන් ඇති වෙළෙන්දකු මෙම නියෝගයෙන් පාන් සඳහා නියමිත උපරිම මිල ගණන් සටහන් කරන ලද දන්වීමක් පැහැදිලිව පෙනෙන සේ එම ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවත් ;

(7) මෙම නියෝගයෙන් උපරිම මිල නියම කොට ඇති සෑම ප්‍රදේශයකම පාන් විකුණන සෑම කෙනෙක්ම, මිලයට ගන්නා අයකු ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ පාන් ගෙඩියේ විස්තර ;
(ඇ) විකුණූ පාන් ප්‍රමාණය ;
(ඈ) විකුණූ පාන් වලට ගෙවූ මුදල ඇතුලත් කුවිතාන්සියක් මිලයට ගන්නාට දියයුතු බවත් ;

මෙම නියෝගයෙන් නියම කරමි.

(8) තවද, '' අවුන්ස '' යනුවෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත අවුන්සයේ බර බවද නියම කරමි.

1973 ජනවාරි මස 12 වැනි දින පෙ.ව. 10 ට ගාල්ලේ දිසාපති කාර්‍යාලයේ දී අත්සන් කරන ලදී.

හෙ. විජේතිලක,
ගාලු පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිල පාලක,
(ආහාර හා විවිධ ද්‍රව්‍ය).

උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>අවුන්ස 8කට වඩා බර පාන් සඳහා අදල වැඩිම මිල<br>රු. ශ. | 3 වැනි තීරය<br>අවුන්ස 8ක් හෝ ඊට අඩු පාන් සඳහා අදල වැඩිම මිල<br>රු. ශ. |
|---|---|---|
| ගාලු දිස්ත්‍රික්ක සීමාවන්ට ඇතුලත් ප්‍රදේශ ... ... ... ... | අවුන්ස 16 ක් 0 40 ... | අවුන්ස 8 ක් 0 21 |

**සැලකිය යුතුයි.**—මේ මිල ගණන් පාන් විකිණිය යුතු නියමිත මිල නොවේ. මේවා පාන් විකිණිය හැකි උපරිම මිල ගණන් වේ. එම මිළ ගණන්වලට ඉහලින් පාන් විකිණිය නොහැක.

3–60/1—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය.

---

**1973 අංක ජී 2 දරණ ආහාර මිල ආඥාව.** **තිරිඟු පිටි.**

මිල පාලන පනත

(173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 3 (2) වගන්තිය සමග කියවිය යුතුව 4වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගාලු දිස්ත්‍රික්කයේ සහකාර මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) තැන්පත් හෙන්රි විජේතිලක වන මම මේ ආඥාවෙන්—

(1) 1969 මාර්තු 17 වන දින අංක 14,845/4 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලවූ 1969 මාර්තු 14 වන දින අංක ජී 3 දරණ ආහාර මිල ආඥාව වහාම බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

(2) මෙයට යාකර ඇති පළමුවැනි උපලේඛනයේ සඳහන් ද්‍රව්‍ය මෙදින සිට මෙයට යාකර ඇති දෙවන උපලේඛනයෙහි පළමුවැනි තීරයෙහි සඳහන් ගාලු පාලන දිස්ත්‍රික්කය තුල පිහිටි එක් එක් ප්‍රදේශයන්හි තොග වෙළෙන්දකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තල් 148 ක් විකිණිය හැකි වැඩිම මිල එහිවූ දෙවැනි උපලේඛනයේ දෙවැනි තීරයෙහි සඳහන් මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙයට යාකර ඇති පළමුවැනි උපලේඛනයේ සඳහන් ද්‍රව්‍ය මෙදින සිට මෙයට යාකර ඇති දෙවන උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ගාලු පාලන දිස්ත්‍රික්කය තුල පිහිටි එක් එක් ප්‍රදේශයන්හි සිල්ලර වෙළෙන්දකු විසින් පාරිභෝගිකයකුට විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිල එහිමවූ දෙවැනි උපලේඛනයේ තුන්වැනි තීරයෙහි සඳහන් මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) තිරිඟු පිටි ශුද්ධ බරින් රාත්තල් 148කට වඩා වැඩියෙන් හෝ අඩුවෙන් තොග වශයෙන් ඕනෑම ප්‍රමාණයක් විකිණීමේදී ඊට ගෙවිය යුතු වැඩිම මිල ගණන සාදගත යුත්තේ මෙයට යාකර ඇති දෙවැනි උපලේඛනයේ දෙවැනි තීරයෙහි සඳහන් ශුද්ධ බරින් රාත්තල් 148ක් විකිණිය හැකි වැඩිම තොග මිල ප්‍රමාණය අනුව සළකා ක්‍රමානුකූලව ගණන් බැලීමෙනි.

(5) තවද මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) මෙයට යාකොට ඇති පළමුවැනි උපලේඛනයෙහි සඳහන් තිරිඟු පිටි යන්නට ඉරිඟු පිටි මිශ්‍ර තිරිඟු පිටිද ඇතුලත් යයි සලකනු ලැබේ.

(ආ) තිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීමද ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් එකවර විකිණීමද තොග වෙළඳාමක් සේ සලකනු ලැබේ.

(ඇ) ශුද්ධ බරින් හොණ්ඩරයකට වඩා අඩු තිරිඟු පිටි ප්‍රමාණයක් ආහාරය සඳහා විකිණීම සිල්ලර වෙළඳාමක් සේ සලකනු ලැබේ.

(6) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ කිසියම් ප්‍රදේශයක තිරිඟු පිටි සමග හැර, වෙන කිසියම් ද්‍රව්‍යයක් සමග මිශ්‍රකර නොවිකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක තිරිඟු පිටි සිය ස්වාමිත්වයේ හෝ තමාගේ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙක්ම එම තිරිඟු පිටිවලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා ඒ පිටිවලට මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිල උසින් අඟලකට වඩා අඩු නොවූද ඉලක්කම්වලින් මිල පුවරුවක සටහන් කොට එම පුවරුවට එම භාජනය ඇඳා එම පිටිද එම පුවරුවද ඕනෑම ගනුදෙනුකාරයකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව මෙයින් නියම කරමි.

(8) එසේම මෙම නියෝගයෙහි කාර්ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා. '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපෝයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද මෙයින් නියම කරමි.

(9) තවද මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම තිරිඟු පිටි විකුණන සියල්ලෙක්ම තොග වශයෙන් විකිණීමේදී කුවිතාන්සි නිකුත් කිරීම අවශ්‍ය බවද සිල්ලර වශයෙන් මිලදී ගන්නා අය ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර සහිත කුවිතාන්සියක් ඔවුනට දිය යුතු බවද මෙයින් නියම කරමි :—

(අ) විකුණූ දිනය;

(ආ) තිරිඟු පිටි විකුණූ ප්‍රමාණය (බර අනුව);

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද නැතහොත් සිල්ලර වශයෙන්ද යන වග.

(10) තිරිඟු පිටි විකිණීමේදී ඒ යම්කිසි දෙයක බහාලනු ලැබුවේ නම් හෝ ඔතනු ලැබුවේ නම් එහි මිලත් මෙම නියෝගයේ නියමිත මිල ගණන් වලට ඇතුලත් බව මෙයින් නියම කරමි.

1973 ජනවාරි මස 12 වැනි දින පෙ.ව. 10 ට ගාල්ලේ දිසාපති කාර්‍යාලයේ දී අත්සන් කරන ලදී.

හෙ. විජේතිලක,
ගාලු පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිල පාලක,
(ආහාර හා විවිධ ද්‍රව්‍ය).

පළමුවැනි උපලේඛනය

හැඳින්වීම හා වර්ගය—තිරිඟු පිටි

දෙවැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>රාත්තල් 148 ක් ශුද්ධ බර තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල<br>රු. ශ. | 3 වැනි තීරය<br>සිල්ලර වශයෙන් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිල<br>රු. ශ. |
|---|---|---|
| ගාලු නාගරික සීමාව සහ කඩවත් සතර, අක්මීමණ ගම්කාර්ය සභා සීමාව, බෝපෙ ගාම්කාර්ය සභා සීමාව, පෝද්දල ගම්කාර්ය සභා සීමාව ... ... ... ... ... | 56 68 ... | 0 39½ |
| අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභා සීමාව, මාදම්පෙ ගම්කාර්ය සභා සීමාව ... ... | 56 89 ... | 0 39½ |
| වකුගෙදර සුළු නගර සභා සීමාව, කරන්දෙනිය ගම්කාර්ය සභා සීමාව ... ... ... | 56 95 ... | 0 39½ |
| වේරගොඩ ගම්කාර්ය සභා සීමාව, බටපොල ගම්කාර්ය සභා සීමාව ... ... ... | 56 89 ... | 0 39½ |
| අහංගම සුළු නගර සභා සීමාව, කතළුව ගම්කාර්ය සභා සීමාව, කහඳ-නාකන්ද ගම්කාර්ය සභා සීමාව, පිලාන මැටරඹ ගම්කාර්ය සභා සීමාව, පරගොඩ ගම්කාර්ය සභා සීමාව ... ... ... | 56 97 ... | 0 40 |
| හබරාදූව ගම්කාර්ය සභා සීමාව (මැලෑගොඩ ග්‍රාම සේවක කොට්ඨාශය හැර) ... ... | 56 76 ... | 0 40 |
| මැලෑගොඩ ග්‍රාම සේවක කොට්ඨාශය ... ... ... ... | 56 73 ... | 0 40 |
| කෝද්දගොඩ ගම්කාර්ය සභා සීමාව සහ පොල්පාගොඩ ගම්කාර්ය සභා සීමාව ... ... | 56 97 ... | 0 40 |
| කොට්ටාව ගම්කාර්ය සභා සීමාව ... ... ... ... ... | 57 0 ... | 0 40 |
| බද්දේගම ගම්කාර්ය සභා සීමාව, වඳුරඹ ගම්කාර්ය සභා සීමාව, තෙලිකඩ-මාපුවාන ගම්කාර්ය සභා සීමාව | 56 87 ... | 0 39½ |
| පිටිගල-වැයිහේන ගම්කාර්ය සභා සීමාව (පිටිගල ග්‍රාම සේවක කොට්ඨාශය හැර) ... ... | 57 24 ... | 0 40 |
| පිටිගල ග්‍රාම සේවක කොට්ඨාශය ... ... ... ... ... | 56 61 ... | 0 39½ |
| පෝද්දිවෙල නියාගම ගම්සභා සීමාව, වැලිවිටිය දිවිතුර ගම්කාර්ය සභා සීමාව ... ... | 57 24 ... | 0 40 |
| දෙඩන්දූව සුළු නගර සභා සීමාව, රත්ගම ගම්කාර්ය සභා සීමාව ... ... ... | 56 62 ... | 0 39½ |
| හික්කඩුව සුළු නගර සභා සීමාව, තොටගමුව, තිරාණගම ගම්කාර්ය සභා සීමාව, ගෝනාපීනුවල මීටියාගොඩ ගම්කාර්ය සභා සීමාව ... ... ... ... ... | 56 68 ... | 0 39½ |
| බලපිටිය සුළු නගර සභා සීමාව ... ... ... ... ... | 56 97 ... | 0 40 |
| ඌරගස්මංහන්දිය, ගම්කාර්ය සභා සීමාව, පහලගම්භය ගම්කාර්ය සභා සීමාව ... ... | 57 15 ... | 0 40 |
| කොස්ගොඩ ගම්කාර්ය සභා සීමාව ... ... ... ... ... | 57 03 ... | 0 40 |
| බෙන්තොට සුළු නගර සභා සීමාව, ඉඳුරුව ගම්සභා සීමාව ... ... ... | 57 18 ... | 0 40 |
| ඇල්පිටිය සුළු නගර සභා සීමාව, අම්බන-පිනිකහන ගම්කාර්ය සභා සීමාව, ගොලුවාමුල්ල-ඕමත්ත ගම්කාර්ය සභා සීමාව ... ... ... ... ... ... | 56 50 ... | 0 39½ |
| නාගොඩ මාපලගම ගම්කාර්ය සභා සීමාව, උඩුගම ගම්කාර්ය සභා සීමාව, යටලමත්ත ගම්කාර්ය සභා සීමාව | 57 14 ... | 0 40 |
| නිනිදුම ගම්කාර්ය සභා සීමාව, ඕපාත ගම්සභා සීමාව, නෙළුව ගම්කාර්ය සභා සීමාව, දෙල්ලව ගම්කාර්ය සභා සීමාව ... ... ... ... ... | 57 42 ... | 0 40 |

සැළකිය යුතුයි.—මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය හැකි නියම මිල නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉහලම මිල ගණන්ය. මේ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

3–60/2—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය.

**කේ.ඇල්. 2 දරණ මිල නියෝගය.** **කිරිඟු පිටි.**

මිල පාලන පනත

නියෝගය

කළුතර දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර හා විවිධ ද්‍රව්‍ය) පාලක තැන්පත් ගාල්ලගේ ආයසීපාල ද සිල්වා වන මම(173 වන අධිකාරය වන) 3 (2) වගන්තිය මිල පාලන පනත හා කියවිය යුතු 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1971 නොවැම්බර් මස 29 වැනි දින අංක 14,776/13 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1971 නොවැම්බර් මස 25 වැනි දින දරණ කේ.ඇල්. 119 දරණ ආහාර මිල නියෝගය මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 වැනි තීරුවේ සඳහන් මිල ගණන් තිරිඟු පිටි තොග වශයෙන් විකිණීමේදී, ශුද්ධ බර රාත්තල් 148 ක් එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශයන්හි මේ දුන් සිට විකිණිය හැකි වැඩිම මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මීට යාකර ඇති 2 වැනි උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් මිල ගණන්, තිරිඟු පිටි සිල්ලර වශයෙන් විකිණීමේදී, ශුද්ධ බර රාත්තලක මිල එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල විකිණිය හැකි වැඩිම මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) තිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ තිරිඟු පිටි වරකට ශුද්ධ බර රාත්තල් 148ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) තිරිඟු පිටි පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර රාත්තල් 148 ට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ඇ) තිරිඟු පිටි හා ඉරිඟු පිටි එකට කලවම් කළවිට එය '' තිරිඟු පිටි '' නමින් හැඟවෙන බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(5) තවද, තිරිඟු පිටි, ඉරිඟු පිටි හැර වෙන කිසිම ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බවද, මෙයින් නියම කරමි.

(6) තවද, බරින් සියයට 10කට වැඩියෙන් ඉරිඟු පිටි කලවම් කරන ලද තිරිඟු පිටි කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවද, මෙයින් නියම කරමි.

(7) තවද, තිරිඟු පිටි විකුණන විට යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිලත්, මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිල ගණන්වලට ඇතුළත් වන බවද, මෙයින් නියම කරමි.

(8) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක තිරිඟු පිටි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටන සෑම වෙළෙන්දෙකුම තිරිඟු පිටිවලින් ප්‍රමාණයක් යුදුසු භාජනයක දමා මේ නියෝගයේ වැඩිම මිල, උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිල පුවරුවක සඳහන් කොට එම භාජනයට සම්බන්ධ කොට නියමිත වැඩිම මිල ඕනෑම ගණුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(9) තවද, කළුතර නගර සභා සීමාව ඇතුළත, තිරිඟු පිටි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිලයට ගන්නා අයෙකු විසින් ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය;

(ආ) තිරිඟු පිටි විකුණූ ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිලට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(10) එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා '' රාත්තල '' හෙවත් ''රා.'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තල බවද, නියම කරමි.

1973 පෙබරවාරි මස 01 වැනි දින පෙ.ව. 8 ට කළුතර කච්චේරියේදී අත්සන් කරන ලදී.

ජී. ඒ. ද සිල්වා,
කළුතර දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර හා විවිධ ද්‍රව්‍ය) පාලක.

**පළමුවැනි උපලේඛනය**

| 1 වැනි තීරය | | 2 වැනි තීරය |
|---|---|---|
| ප්‍රාදේශීය ආදයම් නිළධාරිතැනගේ කොට්ඨාශය | ප්‍රදේශය | ශුද්ධ බර රාත්තල් 148 ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල රු. ශ. |
| රයිගම් කෝරළය නැගෙනහිර ... ... ... ... | ඉංගිරිය ... | 55 99 |
| | හොරණ ... | 55 78 |
| | මදුරාවල ... | 55 92 |
| | මිල්ලෑව ... | 55 87 |
| | ගල්පාත ... | 55 96 |
| රයිගම් කෝරළය බටහිර ... ... ... ... | බණ්ඩාරගම ... | 55 75 |
| | මැද්දෙවත්ත–හල්තොට ... | 55 85 |
| පානදුරා තොටමුණ ... ... ... ... | පානදුර ... | 55 56 |
| | අළුබෝමුල්ල ... | 55 64 |
| | කන්තිරිමුල්ල ... | 55 59 |
| කළුතර තොටමුණ උතුර ... ... ... ... | කළුතර ... | 55 78 |
| | වස්කඩුව ... | 55 78 |
| | වාද්දුව ... | 55 70 |
| කළුතර තොටමුණ දකුණ ... ... ... ... | අලුත්ගම ... | 56 04 |
| | බේරුවල–දර්ගා ... | 55 96 |
| | පය්යාගල–මග්ගොන ... | 55 92 |
| පස්දුන් කෝරළය බටහිර ... ... ... ... | මතුගම ... | 56 06 |
| | වැලිපැන්න ... | 56 11 |
| | සපුගහවත්ත ... | 55 96 |
| | නෑබොඩ ... | 56 06 |
| පස්දුන් කෝරළය දකුණ ... ... ... ... | ඉත්තෑපාන ... | 56 13 |
| | මීගහතැන්න ... | 56 24 |
| ගඟබඩ පත්තුව ... ... ... ... | බුලත්සිංහල ... | 55 99 |
| පස්දුන් කෝරළය නැගෙනහිර ... ... ... ... | අගලවත්ත ... | 56 06 |
| | ලත්පඳුර ... | 56 16 |
| | මහගම ... | 56 18 |

## දෙවෙනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ග්‍රාම සේවක කොට්ඨාශ අංක | ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාශය | 2 වැනි තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| 604 සිට 642 සහ 648 සහ 650 සහ 650ඒ | රයිගම් කෝරළය නැගෙනහිර | 0 39 |
| 643 සිට 647 සහ 649 සහ 651 සිට 669 | රයිගම් කෝරළය බටහිර | 0 39 |
| 670 සිට 697ඒ සහ 699 සහ 702 | පානදුරා තොටමුණ | 0 39 |
| 698 සහ 700 සහ 701 සහ 703 සිට 732 | කළුතර තොටමුණ උතුර | 0 39 |
| 733 සිට 770 | කළුතර තොටමුණ දකුණ | 0 39 |
| 771 සිට 776 සහ 792 සිට 810 | පස්දුන් කෝරළය බටහිර | 0 39½ |
| 777 සිට 791 සහ 842 සහ 843 සහ 843ඒ සහ 844ඒ සහ 848 සිට 850 | පස්දුන් කෝරළය දකුණ | 0 39½ |
| 811 සිට 825 | ගහබඩපත්තුව | 0 39½ |
| 826 සිට 841 සහ 844 සහ 845 සිට 847 | පස්දුන් කෝරළය නැගෙනහිර | 0 39½ |

සටහන.—(i) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිළ ගණන් වේ. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

(ii) ශුද්ධ බර රාත්තල් 148 කට අඩු හෝ වැඩි කිසියම් තිරිඟු පිටි ප්‍රමාණයක් තොග වශයෙන් විකුණන විට ශුද්ධ බර රාත්තල් 148 ක් තොග වශයෙන් විකිණිය හැකි ඉහත සඳහන් උපරිම මිලේ අනුපාතය අනුව ගෙවිය යුතු මිළ ගණන් බැලිය යුතුය.

3–1003/1—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

කේ.ඇල්. 3 දරණ ආහාර මිළ නියෝගය. පාන්

## මිළ පාලන පනත

### නියෝගය

කළුතර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර හා විවිධ ද්‍රව්‍ය) පාලක තැන්පත් ගාල්ලගේ ආයාපාල ද සිල්වා වන මම (173 වන අධිකාරිය වන) මිළ පාලන පනතේ අංක 3(2) දරණ වගන්තිය සමග කියවිය යුතු අංක 4 දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1967 නොවැම්බර් මස 29 වැනි දින අංක 14,776/13 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1971 නොවැම්බර් මස 25 වැනි දින අංක 120 දරණ ආහාර මිළ නියෝගය මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 වැනි සහ 3 වැනි තීරුවල සඳහන් මිළ, එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල පිළිවෙලින් අවුන්ස 16 හා 8 වේ පාන්ගෙඩි මේ දුන් සිට විකිණිය හැකි උපරිම මිළ බවත් එකී මිළට වැඩියෙන් එම ප්‍රදේශවල එම පාන්ගෙඩි නොවිකිණිය යුතු බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම මිළ නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 16 යේ පාන් ගෙඩියකට නියමිත වැඩිම මිළේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන් එම ප්‍රදේශය තුළ අවුන්ස 8 කට වඩා බර පාන්ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8කට වඩා බර කිසියම් කොටසක් නොවිකිණිය යුතු බවත්,

(4) මෙම මිළ නියෝගයෙන් කිසියම් ප්‍රදේශයක් සඳහා අවුන්ස 8වේ පාන්ගෙඩියකට නියමිත වැඩිම මිළේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන් එම ප්‍රදේශය තුළ අවුන්ස 8 කට වඩා බර නොවූ පාන්ගෙඩියක් හෝ පාන්ගෙඩියකින් අවුන්ස 8 කට වඩා බර නොවූ කිසියම් කොටසක් නොවිකිණිය යුතු බවත්,

(5) පාන් විකුණන විට ඔතා දෙනු ලබන දෙයක් වෙතොත් එහි මිළත්, මෙම නියෝගයෙන් නියමිත උපරිම මිළ ගණන්වලට ඇතුළත් බවත්,

(6) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියෝග කොට ඇති සෑම ප්‍රදේශයකම සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ කිසියම් ස්ථානයක හෝ වාහනයක පාන් ඇති වෙළෙන්දෙකු මෙම නියෝගයෙන් පාන් සඳහා නියමිත උපරිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් පැහැදිලිව පෙනෙන සේ එම ස්ථානයේ හෝ වාහනයේ හෝ තැබිය යුතු බවත්,

(7) මෙම නියෝගයෙන් උපරිම මිල නියම කොට ඇති සෑම ප්‍රදේශකයම පාන් විකුණන සෑම කෙනෙක්ම, මිළට ගන්නා අයෙකු ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය,
(ආ) විකුණූ පාන්ගෙඩියේ විස්තරය,
(ඇ) විකුණූ පාන් ප්‍රමාණය,
(ඈ) විකුණූ පාන්වලට ගෙවූ මුදල ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවත්; මෙම නියෝගයෙන් නියම කරමි.

(8) තවද, ''අවුන්ස'' යනුවෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත අවුන්සයේ බර බවද නියෝග කරමි.

ජී. ඒ. ද සිල්වා,
කළුතර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර හා විවිධ ද්‍රව්‍ය) පාලක.

1973 පෙබරවාරි මස 1 වැනි දින,
පෙ. ව. 8.00 ට කළුතර කච්චේරියේ දී අත්සන් කරන ලදී.

## උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>අවුන්ස 8කට වඩා බර පාන් සඳහා අදල වැඩිම මිළ | රු. ශ. | 3 වැනි තීරය<br>අවුන්ස 8ක පාන් සඳහා අදල වැඩිම මිළ | රු. ශ. |
|---|---|---|---|---|
| ග්‍රාම සේවක කොට්ඨාශ අංක 604 සිට 642 සහ 648 සහ 650 සහ 650ඒ රයිගම් කෝරළය නැගෙනහිර<br>643 සිට 647 සහ 649 සහ 651 සිට 669 රයිගම් කෝරළය බටහිර 670 සිට 697ඒ සහ 699 සහ 702 පානදුරා තොටමුණ 698 සහ 700 සහ 701 සහ 703 සිට 732 කළුතර තොටමුණ උතුර<br>773 සිට 770 කළුකර තොටමුණ දකුණ | අවුන්ස 16ක් | 0 39 | අවුන්ස 8ක් | 0 20 |
| 771 සිට 776 සහ 792 සිට 810 පස්දුන් කෝරළය බටහිර 777 සිට 791 සහ 842 සහ 843 සහ 843ඒ සහ 844 ඒ සහ 848 සිට 850 පස්දුන් කෝරළය දකුණ<br>811 සිට 825 ගහබඩ පත්තුව 826 සිට 841 සහ 844 සහ 845 සිට 847 පස්දුන් කෝරළය නැගෙනහිර | අවුන්ස 16 ක් | 0 40 | අවුන්ස 8ක් | 0 20 |

සටහන.—මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

3—1003/2—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

ආපා. 5/13/73 දරණ ආහාර මිළ නියෝගය. කිරිඟු පිටි

**මිළ පාලන පනත**

**නියෝගය**

අම්පාර පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් රතුගමගේ සිරිල් ඇන්ටනී ප්‍රනාන්දු වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1968 අප්‍රේල් 11 වන දින අංක 14,797/2 දරණ ලංකා ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක ආපා. 5/13/68 හා 1968 අප්‍රේල් 11 වන දින දරන ආහාර මිළ නියෝගය මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති I වන උපලෙඛනයේ 2 වන තීරයේ සඳහන් තිරිඟු පිටි තොග වෙළෙන්දන් විසින් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තල් 148 එම උපලෙඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශවල මේ දුන් පටන් විකිණිය හැකි වැඩිම මිළ බව මෙයින් නියෝග කරමි.

(3) මීට යාකර ඇති II වන උපලෙඛනයේ 2 වන තීරයේ සඳහන් තිරිඟු පිටි සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් එම උපලෙඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශවල මේ දුන් පටන් විකිණිය හැකි වැඩිම මිළ බව මෙයින් නියෝග කරමි.

(4) තවද, මෙම නියෝගයේ කාර්යය සඳහා—

(අ) තිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ තිරිඟු පිටි වරකට ශුද්ධ බර රාත්තල් 148 හෝ ඊට වැඩි ප්‍රමාණයක් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) තිරිඟු පිටි පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර රාත්තල් 148 ට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ඇ) තිරිඟු පිටි හා ඉරිඟු පිටි එකට කලවම් කළ විට එය "තිරිඟු පිටි" නමින් හැඟවෙන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(5) තවද, තිරිඟු පිටි ඉරිඟු පිටි හැර වෙන කිසිම ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව ද මෙයින් නියම කරමි.

(6) තවද, බරින් 10% කට වැඩියෙන් ඉරිඟු පිටි කලවම් කරන ලද තිරිඟු පිටි කිසිවකු විසින් නොවිකිණිය යුතු බවද මෙයින් නියම කරමි.

(7) තවද, තිරිඟු පිටි විකුණන විට යම් කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිලත් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිල ගණන්වලට ඇතුළත් වන බවද මෙයින් නියම කරමි.

(8) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ තිරිඟු පිටි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම තිරිඟු පිටි වලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කමින් මිළ පුවරුවක සඳහන් කොට, එකී ද්‍රව්‍ය හා නියමිත වැඩිම මිල ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවද නියම කරමි.

(9) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම තිරිඟු පිටි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය,

(ආ) තිරිඟු පිටි විකුණූ ප්‍රමාණය (බර අනුව),

(ඇ) තිරිඟු පිටි විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල, සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන් ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බව ද නියම කරමි.

(10) එසේම මෙම නියෝගයේ කාර්යය සඳහා "රාත්තල" හෝ "රා." යනුවෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

1973 පෙබරවාරි මස 17 වැනි දින පෙ.ව. 8.30 ට අම්පාර කච්චෙරියේදී අත්සන් තබන ලදී.

සිරි ප්‍රනාන්දු,
සහකාර මිළ (ආහාර) පාලක,
අම්පාර දිස්ත්‍රික්කය.

**I වන උපලෙඛනය**

| 1 වන තීරය | 2 වන තීරය |
|---|---|
| ප්‍රදේශය | තිරිඟු පිටි ශුද්ධ බර රාත්තල් 148 ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
| 1. අම්පාර නගරය (උහන, පරගහකැලේ, වාවින්න, දමන, පල්ලන්ඔය, හිඟුරාන, යන ප්‍රදේශ ඇතුළුව) | 58 17 |
| 2. ගොනාගොල්ල ප්‍රදේශය (බක්කිඇල්ල ප්‍රදේශය ඇතුළුව) ... ... ... | 58 33 |
| 3. මධ්‍ය කඳවුර ප්‍රදේශය ... ... | 58 20 |
| 4. කරවාහුපත්තු සහ නින්තාවුර් පත්තු ප්‍රදේශ ... | 57 94 |
| 5. සමන්තුරේ පත්තු ප්‍රදේශය (අම්පාර නගරය හැර) ... | 58 04 |
| 6. අක්කරපත්තු ප්‍රදේශය ... ... | 58 17 |
| 7. පානමපත්තු ප්‍රදේශය ... ... | 58 50 |

**II වන උපලෙඛනය**

| 1 වන තීරය | 2 වන තීරය |
|---|---|
| ප්‍රදේශය | තිරිඟු පිටි ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
| 1. අම්පාර නගරය ((උහන, පරගහකැලේ, වාවින්න, දමන, පල්ලන්ඔය, හිඟුරාන යන ප්‍රදේශ ඇතුළුව) ... | 0 40½ |
| 2. ගොනාගොල්ල ප්‍රදේශය (බක්කිඇල්ල ප්‍රදේශය ඇතුළුව) ... ... ... | 0 40½ |
| 3. මධ්‍ය කඳවුර ප්‍රදේශය ... ... | 0 40½ |
| 4. කරවාහුපත්තු සහ නින්තාවුර්පත්තු ප්‍රදේශය ... | 0 40½ |
| 5. සමන්තුරේ පත්තු ප්‍රදේශය (අම්පාර නගරය හැර) ... | 0 40½ |
| 6. අක්කරපත්තු ප්‍රදේශය ... ... | 0 40½ |
| 7. පානමපත්තු ප්‍රදේශය (කුමන ප්‍රද්ශය හැර) ... | 0 41 |
| 8. කුමන ප්‍රදේශය... ... ... | 0 42½ |

සැළකිය යුතුයි..—(1) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිල නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. මේ මිල ගණන්වලට ඉහලින් එම ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

(2) තිරිඟු පිටි රාත්තල් 148 කට වැඩි හෝ අඩු ප්‍රමාණයක් තොග වශයෙන් විකිණීමේදී එයට ගෙවිය යුතු වැඩිම ගණන, ශුද්ධ බර රාත්තල් 148 ක ප්‍රමාණය ඉහත සඳහන් මිළ අනුව ප්‍රමාණය කර ගණන් බැලිය යුතුයි.

3–200—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

ආපා/5/27/73 දරණ ආහාර මිළ නියෝගය. පාන්

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

අම්පාර පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් රතුගමගේ සිරිල් ඇන්ටනී ප්‍රනාන්දු වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව —

(1) 1967 දෙසැම්බර් 3 වැනි දින අංක 14,777/5 දරණ ලංකා ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ සඳහන් අංක ආපා/5/27/67 හා 1967 තේ දෙසැම්බර් 3 වැනි දින දරණ ආහාර මිළ නියෝගය මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 වැනි සහ 3 වැනි තීරවල සඳහන් මිළ, එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල පිළවෙලින් අවුන්ස 16 හා අවුන්ස 8 පාන් ගෙඩි 1973 ජනවාරි 11 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට විකිණිය හැකි වැඩිම මිළ බවත්, එකී මිළට වැඩියෙන් එම ප්‍රදේශවල එම පාන් ගෙඩි නොවිකිණිය යුතු බවත් මෙම නියෝගයෙන් නියම කරමි,

(3) තවද, මෙම මිළ නියෝගයෙන් යම්කිසි ප්‍රදේශයක් සඳහා අවුන්ස 16 ක පාන් ගෙඩියකට නියමිත වැඩිම මිලේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන් එම ප්‍රදේශය තුල අවුන්ස 8 කට වඩා බර පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8 කට වඩාබර කිසියම් කොටසක් නොවිකිණිය යුතු බවත් ;

(4) මෙම මිළ නියෝගයෙන් යම්කිසි ප්‍රදේශයක් සඳහා අවුන්ස 8 වේ පාන් ගෙඩියකට නියමිත වැඩිම මිලේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන්, එම ප්‍රදේශය තුල අවුන්ස 8 කට වඩා බර නොවූ පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියකින් අවුන්ස 8 කට වඩා බර නොවූ කිසියම් කොටසක් නොවිකිණිය යුතු බවත් ;

(5) පාන් විකුණන විට ඔතා දෙනු ලබන දවටනයක් වෙතොත් එහි මිළත් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් වලට ඇතුලත් බවත් ;

(6) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සැම ප්‍රදේශයකම සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ කිසියම් ස්ථානයක හෝ වාහනයක පාන් ඇති වෙළෙන්දෙකු මෙම නියෝගයෙන් පාන් සඳහා නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් පැහැදිළිව පෙනෙන සේ එම ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවත්;

(7) මෙම නියෝගයෙන් වැඩිම මිල නියම කොට ඇති සැම ප්‍රදේශයකම පාන් විකුණන සැම කෙනෙකුම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම්—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ පාන් ගෙඩියේ විස්තරය ;

(ඇ) විකුණූ පාන් ප්‍රමාණය ;

(ඈ) විකුණූ පාන් වලට ගෙවූ මුදල ඇතුලත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(8) තවද, " අවුන්ස " යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩූපොයි බර ක්‍රමය අනුව සම්මත අවුන්සයේ බර බවද නියෝග කරමි.

1973 පෙබරවාරි මස 17 දින පෙ.ව. 8.30 ට අම්පාර කච්චේරියේදී අත්සන් කරන ලදී.

සිරි ප්‍රනාන්දු,
සහකාර මිළ (ආහාර) පාලක, අම්පාර දිස්ත්‍රික්කය.

උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| ප්‍රදේශය | අවුන්ස 8 කට වඩා බර පාන් සඳහා අදල වැඩිම මිළ | අවුන්ස 8 ක් හෝ ඊට අඩු පාන් සඳහා අදල වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| 1. කරවාහුපත්තු, නින්තවූර්පත්තු සහ සමන්තුරේපත්තු ... ... ... | 0 42 ... | 0 21 |
| 2. අක්කරපත්තු සහ වැවගම්පත්තු ... ... ... ... | 0 43 ... | 0 22 |
| 3. පානමපත්තු ... ... ... ... ... | 0 44 ... | 0 22 |

පැලකිය යුතුයි.—මේ මිළ ගණන් පාන් විකිණිය යුතු නියම මිළ නොවේ. මෙවා පාන් විකිණිය හැකි උපරිම මිළ ගණන් වේ. ඒ මිළ ගණන් වලට ඉහලින් පාන් විකිණිය නොහැකිය.

3–201—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

සාමංග. 11

**සමාගම් ආඥපනත (145 වැනි අධිකාරය)**

277 (3) වගන්තිය යටතේ සීමාසහිත කෝරල ඇන්ඩ් කම්පනි නම කපා හැරීමේ දැන්වීම

සමාගම් ආඥපනතේ (145 අධිකාරය) විධිවිධාන යටතේ 1956.9.5 දින සංස්ථාපිත සමාගමක් වන සීමා සහිත කෝරල ඇන්ඩ් කම්පනි ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැන්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, සීමාසහිත කෝරල ඇන්ඩ් සන්ස් නාම, මෙම කායාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම් විසුරුවා හරින බවත් සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් රුවන්පුර ලික්මන්ඩ් ද සිල්වා වන මම, සමාගම් ආඥා පනතේ (145 අධිකාරය) 277 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

රු. ලී. ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1973 පෙබරවාරි මස 9 වන දින,
කොළඹ, සමාගම් රෙජිස්ට්‍රාර් ගේ
දෙපාර්තමේන්තුවේ දීය.

3–2—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

ගවයින් හංවඩු ගැසීම

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නැගෙනහිර කට්ටුකුලම් පත්තු ප්‍රා.ආ.නි. කොට්ඨාශය

1958 අංක 29 දරණ සත්ව පනත යටතේ පනවන ලද 1962.11.29 වැනි දින ලංකාණ්ඩුවේ අංක 13,406 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ රෙගුලාසි වල II වැනි කොටසේ 12 (iii) වගන්තිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නැගෙනහිර කට්ටුකුලම් පත්තු ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ 1973 වර්ෂයේ ගවයින් හංවඩු ගැසීමේ වැඩ පිළිවෙල මෙහි පහත පළ කරමි.

තිස්ස දේවේන්ද්‍ර,
ත්‍රිකුණාමලය දිසාපති.

1973.02.13 වන දින,
ත්‍රිකුණාමලය දිසාපති කාර්යාලයේ දීය.

| ග්‍රා.සේ. කොට්ඨාශ අංකය | ග්‍රා.සේ. කොට්ඨාශ නම | හංවඩු ගසන ස්ථානය | දිනය |
|---|---|---|---|
| 241 ... | නිලාවෙලි ... | නල්ලතම්බි ඉඩම, ගෝපාලපුරය ... ... | 1973 අප්‍රේල් 7, 14 හා 21, පෙ.ව. 8.00 සිට දවල් 12.00 |
| | | ග්‍රා.සං. සමිති ඉඩමේ, ගෝපාලපුරය ... ... | 1973 අප්‍රේල් 9, 23 හා 30, පෙ.ව. 8.00 සිට දවල් 12.00 |
| | | කේ. ඇම්. සුල්තාන්ගේ ඉඩමේ ... ... | 1973 අප්‍රේල් 11, 18 හා 25, පෙ.ව. 8.00 සිට දවල් 12.00 |
| | | වලෙයියුතු වත්ත, ඉරක්කකන්ඩිය ... ... | 1973 අප්‍රේල් 5, 19 හා 26, පෙ.ව. 8.00 සිට දවල් 12.00 |
| 240 ... | කුඹුරුපිටිය ... | ඒ. වී. සුබ්‍රමණියම් ගේ ඉඩමේ කොට්ඨාශ අංක 5, කුඹුරුපිටිය... | 1973 අප්‍රේල් 1, 8 හා 15, පෙ.ව. 8.00 සිට දවල් 12.00 |
| | | එන්. තාමෝදරම්පිල්ලේ කිරි පට්ටියේ, කොට්ඨාශය 5, කුඹුරුපිටිය | 1973 අප්‍රේල් 9, 23 හා 30, පෙ.ව. 8.00 සිට දවල් 12.00 |
| | | වී. කාතියාගපිල්ලේ ඉඩමේ කොට්ඨාශය 5, කුඹුරුපිටිය ... | 1973 අප්‍රේල් 11, 18 හා 25, පෙ.ව. 8.00 සිට දවල් 12.00 |
| | | රෝමන් කතෝලික පල්ලි භූමිය, කොට්ඨාශය 5, කුඹුරුපිටිය... | 1973 අප්‍රේල් 5, 19 හා 26, පෙ.ව. 8.00 සිට දවල් 12.00 |
| 239 ... | කුච්චවෙලි ... | අලගර් ඉඩම, ඉරනකර්නි ... ... | 1973 අප්‍රේල් 9, 23 හා 30, පෙ.ව. 8.00 සිට දවල් 12.00 |
| | | සිවලිංගම්ගේ ඉඩම, ඉරනකර්නි ... ... | 1973 අප්‍රේල් 11, 18 හා 25, පෙ.ව. 8.00 සිට දවල් 12.00 |
| | | කන්තපිල්ලේගේ කුඹුරේ, කුච්චවෙලි ... ... | 1973 අප්‍රේල් 5, 19 හා 26, පෙ.ව. 8.00 සිට දවල් 12.00 |
| | | තටකෙයිකල්ලූ අසලදී, සින්නවෙලි පාර ... ... | 1973 අප්‍රේල් 7, 14, හා 25, පෙ.ව. 8.00 සිට දවල් 12.00 |
| 237 ... | තිරියායි ... | කුමාර් වත්ත, තිරියාය ... ... ... | 1973 අප්‍රේල් 1, 8 හා 15, පෙ.ව. 8.00 සිට දවල් 12.00 |
| | | පේච්චපිල්ලේගේ ඉඩම ... ... ... | 1973 අප්‍රේල් 9, 23 හා 30, පෙ.ව. 8.00 සිට දවල් 12.00 |
| | | කායවලි කිරි පට්ටියේ, තිරියාය ... ... | 1973 අප්‍රේල් 11, 18 හා 25, පෙ.ව. 8.00 සිට දවල් 12.00 |
| | | සාවිආරු කිරි පට්ටි ඉඩමේ... ... ... | 1973 අප්‍රේල් 5, 19 හා 26 |

3–14—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

## ගවයන් හංවඩු ගැසීම

### ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුතූර් ප්‍රා.ආ.නි. කොට්ඨාශය

1958 අංක 29 දරණ සත්ව පණත යටතේ පණවන ලද 1962.11.29 වැනි දින ලංකාණ්ඩුවේ අංක 13,406 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ රෙගුලාසි වල II වැනි කොටසේ 12 (iii) වගන්තිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුතූර් ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ 1973 වර්ෂයේ ගවයින් හංවඩු ගැසීමේ වැඩ පිළිවෙල මෙහි පහත පළ කරමි.

තිස්ස දේවේන්ද්‍ර,
ත්‍රිකුණාමලය දිසාපති.

1973.02.12 වැනි දින,
ත්‍රිකුණාමලය දිසාපති කාර්යාලයේ දීය.

| ග්‍රා.සේ. කොට්ඨාශ අංකය | ග්‍රා.සේ. කොට්ඨාශ නම | හංවඩු ගසන ස්ථානය | දිනය |
|---|---|---|---|
| 216 | තෝප්පූර් | තෝප්පූර් | සෑම මාසයකම 1 වැනි සෙනසුරාද |
| | | කිලිවෙඩ්ඩි | සෑම මාසයකම 3 වැනි සෙනසුරාද සහ 3 වැනි බදාදා |
| | | එල්.බී. 4 | සෑම මාසයකම 4 වැනි සෙනසුරාද සහ 4 වැනි බදාදා |
| 216ඒ | අල්ලයිනගර් | අල්ලයිනගර් | සෑම මාසයකම 1 වැනි බදාදා |
| | | කරවායි | සෑම මාසයකම 2 වැනි සෙනසුරාද සහ 2 වැනි බදාදා |
| 219 | පල්ලිකුඩියිරිප්පු | පල්ලිකුඩියිරිප්පු | සෑම මාසයකම 1 වැනි සහ 2 වැනි සෙනසුරාද |
| | | නල්ලූර් | සෑම මාසයකම 3 වැනි සහ 4 වැනි සෙනසුරාද |
| 218 | මල්ලිගතිවු | පඩ්ඩිතාල් | සෑම මාසයකම 1 වැනි බදාදා |
| | | මනම්පොඩි වෙඩ්ඩායි | සෑම මාසයකම 1 වැනි සෙනසුරාද |
| | | පෙරුවෙලි | සෑම මාසයකම 2 වැනි බදාදා |
| | | මෙන්කාමම් | සෑම මාසයකම 2 වැනි සෙනසුරාද |
| | | මල්ලිගතිවු | සෑම මාසයකම 3 වැනි සහ 4 වැනි සෙනසුරාද |
| 220 | සම්පූර් | සම්පූර් | සෑම මාසයකම 1 වැනි, 2 වැනි සහ 3 වැනි සෙනසුරාද |
| | | ඉල්ලකනතායි | සෑම මාසයකම 4 වැනි සෙනසුරාද |
| 221 | කුනිතිවු | කුනිතිවු | සෑම මාසයකම 1 වැනි සහ 3 වැනි සෙනසුරාද |
| 222 | කඩ්ඩෙපරිච්චාන් | වෙනයිවූර් | සෑම මාසයකම 1 වැනි සහ 2 වැනි සෙනසුරාද |
| | | කල්ලඩිවෙනායි | සෑම මාසයකම 3 වැනි සහ 4 වැනි සෙනසුරාද |
| 223 | මුතූර් (නැගෙනහිර) | අක්කරවේනෙයි | සෑම මාසයකම 1 වැනි සහ 2 වැනි සෙනසුරාද |
| 224 | මුතූර් (බටහිර) | රාල්කුලි | සෑම මාසයකම 3 වැනි සෙනසුරාද |
| | | වන්නාතුරෙයි | සෑම මාසයකම 4 වැනි සෙනසුරාද |
| 224ඒ | පෙරියපාලම් | කයිවයිකල්වේනයි | සෑම මාසයකම 1 වැනි සෙනසුරාද |
| | | උප්පකච්චමඩු | සෑම මාසයකම 2 වැනි සෙනසුරාද |
| | | ඉලුපයිචෝලයි | සෑම මාසයකම 3 වැනි සහ 4 වැනි සෙනසුරාද |

හංවඩු ගැසීම කළ යුත්තේ 1973 අප්‍රේල් මස සිට 1973 සැප්තැම්බර් දක්වා.

3-15—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

## වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසි—1951

### 3 වැනි රෙගුලාසිය යටතේ නිවේදනය

වර්ෂ 1951 අප්‍රේල් මස 13 වනදා අංක 10,234 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1951 ජූනි මස 29 දා අංක 10,263 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසියෙන් සංශෝධනය කරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසිය 1951 ද 1952 මැයි 2 වන දින අංක 10,390 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසිය ද 1956 ජූනි මස 21 වැනි දින අංක 10,943 රජයේ ගැසට් පත්‍රයෙහි පලකරන ලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසියද 1966 සැප්තැම්බර් මස 30 වැනි දින අංක 14,715 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරනලද වන්දනා (යාපනය දිස්ත්‍රික්කය) රෙගුලාසිය ද පහත සඳහන් විහාර, කෝවිල් සහ පල්ලිවලට 1973 වර්ෂය තුළ දී කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් බල පැවැත්වෙන කාලය වශයෙන් උත්සව වාර මෙයින් නියම කරන ලදී.

| | | පටන් ගන්නා දිනය | අවසන් වන දිනය |
|---|---|---|---|
| 1. | සාන්ත අන්තෝනි පල්ලිය, පාලසීතිව් | 22.03.73 | 25.03.73 |
| 2. | මරුතඩි පිල්ලයියාර් කෝවිල්, මානිපායි | 28.03.73 | 14.04.73 |
| 3. | නයිනතිව් බෞද්ධ විහාරය, වෙසක් | 16.05.73 | 17.05.73 |
| 4. | සිද්ධවරම් අම්මාන් කෝවිල් | 14.05.73 | 28.05.73 |
| 5. | නාගදීප නාගපූෂනී අම්මාන් කෝවිල | 01.07.73 | 16.07.73 |
| 6. | නයිනාතිව් බෞද්ධ විහාරය, පොසොන් | 15.06.73 | 17.06.73 |
| 7. | සාන්ත සෙබැස්තියන් පල්ලිය, පතුමඩු මුලියන් | 29.06.73 | 08.07.73 |
| 8. | මාවිඩ්ඩපුරම් කන්දසාමි කෝවිල | 05.07.73 | 29.07.73 |
| 9. | සාන්ත ජේම්ස් පල්ලිය, කීලාලි | 16.07.73 | 25.07.73 |
| 10. | අවර් ලේඩි ඔෆ් ද හෝලි රෝසරි පල්ලිය සින්නමඩු | 27.07.73 | 05.08.73 |
| 11. | කීරිමලෙයි ආඩිඅමාවාසයි | 29.07.73 | 30.07.73 |
| 12. | සෙල්ලසන්නදි කෝවිල, තොන්ඩම නාරු | 28.08.73 | 12.09.73 |
| 13. | අවලේඩි ඔෆ් ද ගුඩ් වොයේජ් පල්ලිය, චාඩි, වේලනෙයි | 15.09.73 | 24.09.73 |
| 14. | වල්ලිපුරම් කෝවිල, වුන්නාලෙයි | 26.09.73 | 12.10.73 |
| 15. | සෙල්ලසන්දි කෝවිල, තොන්ඩමනාරු කන්දයිස්ට් | 26.10.73 | 01.11.73 |

ඇම්. ටී. ඩබ්ලිව්. අමරසේකර,
යාපනය දිසාපති.

1973 පෙබරවාරි මස 13 දා,
යාපනය දිසාපති කාර්යාලයේ දීය.

3-22—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

---

## කුච්චවේලි තානායම

කුච්චවෙලි තානායම 1973 පෙබරවාරි මස 25 වැනි දින සිට නැවත දනවනතුරු අළුත්වැඩියා කිරීම් සඳහා තාවකාලිකව වසා තබනු ලැබේ.

1973 පෙබරවාරි මස 20 වැනි දින,
ත්‍රිකුණාමලය දිසාපති කාර්යාලයේ දීය.

තිස්ස දේවේන්ද්‍ර,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති.

3-147—73.03.02 දින අංක 49 දරණ ගැසට් පත්‍රය

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමඟ කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාදා පෙරවරු 8 සිට දවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දොස් වලක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන අඟලකට සෑම හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

**12. 1966 මාර්තු 1 වෙනිදා සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමෙ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | මෙරට ශ. | පිටරට රු. | පිටරට ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 43 | 50 | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණ ය.**

***තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | මිළ ශ. | තැපැල් ගාස්තු මෙරට රු. | තැපැල් ගාස්තු මෙරට ශ. |
|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී එක කොටසක් ... ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 60 | 0 | 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රය පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| පෙබරවාරි | ... | 73. 2. 2 සිකුරාද | .. | 73. 1.26 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 2. 9 සිකුරාද | ... | 73. 2. 2 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 2.15 බ්‍රහස්පතින්ද | ... | 73. 2. 9 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 2.23 සිකුරාද | ... | 73. 2.15 බ්‍රහස්. | දවල් 12.00 |
| මාර්තු | ... | 73. 3. 2 සිකුරාද | ... | 73. 2.23 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 3. 9 සිකුරාද | ... | 73. 3. 2 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 3.16 සිකුරාද | ... | 73. 3. 9 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 3.23 සිකුරාද | ... | 73. 3.16 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 3.30 සිකුරාද | ... | 73. 3.23 සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් | ... | 73. 4. 6 සිකුරාද | ... | 73. 3.30 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 4.11 බදාදා | ... | 73. 4. 6 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 4.19 බ්‍රහස්පතින්ද | .... | 73. 4.11 බදාදා | දවල් 12.00 |
| | | 73. 4.27 සිකුරාද | ... | 73. 4.19 බ්‍රහස්. | දවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.